**ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය - 2015**

---------------------------------------------------------------------------------

ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි .

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ගිණුම්කරණ ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකල යුතු නමුත් ජපන් පුහුණු වැඩසටහන වෙනුවෙන් ඉදිරි වර්ෂය සඳහා ලැබී තිබූ රු.166,000 ක් ලැබිය යුතු ගිණුම් වල ශේෂයෙන් අඩුකර දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාඨමාලා ආදායම් හඳුනා ගැනීමේදී ආයතනය විසින් අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඩිප්ලෝමා පාඨමාලා ආදායම තුළ ඉකුත් වර්ෂය හා ඉදිරි වර්ෂය වෙනුවෙන් ලද රු.2,000,000 ක පාඨමාලා ගාස්තු ඇතුළත් කර තිබුණි.

(ආ) රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීම සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබූ අතර, ඉකුත් වර්ෂය දක්වා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය හරහා ආයතනය වෙත ලැබුණු පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන සියල්ලම අයභාර ආදායමක් ලෙසත්, සමාලෝචිත වර්ෂයේ දී එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකමක් ලෙසත් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය ප්‍රතිපූර්ණය කරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් රු.610,677 ක් හා රු.4,913,270 ක් සහ සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපූර්ණය කලයුතු පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් රු.3,421,259 ක් හා රු.585,885 ක් නියමිත පරිදි හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

2009 හා 2010 වර්ෂවලදී විවිධ ආයතන වලින් ලැබී අමාත්‍යාංශය වෙත යවන ලද රු.267,500 ක් මහා භාණ්ඩාගාරය වෙත යවා ඇති නමුත් එය ආයතනයේ ගිණුම්වල තැන්පත් ලෙස ගිණුම්ගත කර තිබුණද එය මහා භාණ්ඩාගාරය මගින් තහවුරු කර නොතිබුණි.

### 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

2014 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායකත්වය වූ රු.143,151 ක් සහ කම්කරු දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කළ යුතු රු.1,170,961 ක මුදල විගණන දිනය වූ 2016 මැයි 04 දින වන විටත් අදාළ ආයතන වෙත නිරවුල් කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම්**

---

2014 ඔක්තෝබර් 17 දිනැති 2/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි සෑම වර්ෂයකම මාර්තු 31 දිනට ප්‍රථම පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතු වුවත් විගණන දිනය වූ 2016 මැයි 04 දින දක්වාම 2015 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,086,785 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.19,441,777 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,354,992 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. භාණ්ඩාගාර පුනරාවර්තන ලැබීම් ගිණුම්ගත කිරීමේදී ඉකුත් වර්ෂවලදී අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ එකතුව රු.15,406,726 ක පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනා නොගැනීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වන මූල්‍ය අතිරික්තයක් පෙන්නුම් කෙරුණි. 2014 හා 2015 වර්ෂවල රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීමේ සංගතභාවයක් නොතිබීම මත 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික, දේපල පිරියත උපකරණ සඳහා වන ක්ෂය හා රාජ්‍ය බදු සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු.4,767,579 ක්වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂය දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. 2014 වර්ෂයේදී රු.27,381,220 ක්වූ දායකත්වය 2015 වර්ෂයේදී සියයට 42 කින් පිරිහීමක් නිරීක්ෂණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---

**4.1 කාර්යසාධනය**

---

2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත ප්‍රකාරව ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ සියළු ක්‍රියාකාරකම් වලදී අදාළ අමාත්‍යවරයාට සහාය වීම, අවශ්‍ය වන අධ්‍යයන පර්යේෂණ සහ විශ්ලේෂණ සිදු කිරීම හා වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍ය සහ සුභසාධනය පිළිබඳ අධ්‍යාපනය, පුහුණු කිරීමේ සහ දැනුවත් කිරීමේ සියළු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආයතනයේ ප්‍රධාන පරමාර්ථ විය.
සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් ඉටුකරගත යුතු කාර්යයන් හා ඒවා ඉටු කිරීමේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම්කර තිබූ පාඨමාලා 03 ක් පවත්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී උක්ත ආයතනයේ පරමාර්ථ අතරින් බොහොමයක් පරමාර්ථ ඉටුකර ගැනීම පිළිබඳව ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---

ආයතනය ආරම්භයේ සිට ඩිප්ලෝමා පාඨමාලා 2ක් සහ සහතික පත්‍ර පාඨමාලා 03ක් පවත්වා සහතික පත්‍ර ප්‍රදානය කරන නමුත් එම පාඨමාලාවන් අයදුම්කළ සහ සාර්ථක ලෙස නිමකර සහතික පත්‍ර හිමිකරගත් ශිෂ්‍යයන් පිළිබඳ දත්ත පද්ධතියක් නඩත්තු කර නොතිබූ බැවින් නිකුත් කළ සහතික පත්‍ර

තහවුරු කිරීමකදී ආයතනය යම් අසීරුතාවයකට පත්වීමට ඉඩකඩ පවතින බවත් මේ තුලින් වංචාවක් සිදුවීමකට ඉඩකඩ පවතින බවත් නිරීක්ෂණය විය.

**4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ සංවර්ධන කටයුතු සඳහා වර්ෂ 10 ක කාලයක සිට එකතුව රු. 5,644,437 ක් වැයකර තිබුණද එම ගොඩනැගිල්ලේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සැලැසුම් කළ ඉලක්ක ගත ආදායම වැඩිවීමට ප්‍රධාන වශයෙන් පාඨමාලා ගාස්තු වැඩි කිරීම හේතු වී තිබූ අතර ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

**----------------------------------**

ආයතනය විසින් සිදුකරන ලද පාරිසරික මිනුම් පරීක්ෂාවන් සඳහා සම්පත් දායකත්වය සැපයීම වෙනුවෙන් ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාවේ නිර්දේශය සමඟ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව රු.166,500 ක් තාක්ෂණික නිලධාරියෙකුට ගෙවා තිබුණි.

**4.5 කාර්යමණ්ඩල පරිපාලනය**

**----------------------------**

ජ්‍යෙෂ්ඨ හා තෘතීක මට්ටමේ නිලධාරීන් 06 දෙනෙකු ඇතුළු නිලධාරීන් 14 දෙනෙකු සඳහා පුරප්පාඩු පැවති අතර මෙම බඳවාගැනීම් සිදු නොකිරීම තුලින් ආයතනයේ අරමුණු නිසිපරිදි ඉටුකරගැනීමේ දුෂ්කරතාවයන් සිදු විය හැකිය. මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් පසුගිය වර්ෂවලදී ද විගණනයෙන් පෙන්වා දී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**------------------------------------------**

**5.1 විගණන කමිටු**

**----------------**

2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 උපවගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද එය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) පරිදි එය මාස හයකට නොවැඩි කාලයක් තුළ යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 හා 3.6 වගන්ති සංශෝධනයට අදාල 2014 ජූලි 04 දිනැති අතිරේක 28 පරිදි මිල සැඳහුම් ක්‍රමය යටතේ අවම වශයෙන් මිල කැඳවුම් තුනක් ලබාගෙන මිලදී ගැනීම සිදුකළ යුතු, රු.214,000 ක්වූ ප්ලාස්ටික් පුටු හා මේස මිලදී ගැනීමේදී ඊට පටහැනි ලෙස එක් මිල කියුමක් පදනම් කරගෙන මිලදී ගැනීම් සිදුකර තිබුණි.

**5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

--------------------------------

2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ - 18 වගන්තිය පරිදි ආයතනයේ 2013 හා 2014 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තාවන් සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් | | නිරීක්ෂණ |
| --- | --- | --- | --- |
| (අ) | මෙහෙයුම් පාලනය | - | සැලැසුම් කළ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ප්‍රමාණවත් උපාය මාර්ග භාවිතා නොකිරීම. |
| (ආ) | අයවැය ලේඛනමය පාලනය | - | අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස භාවිතා නොකිරීම. |
| (ඇ) | කාර්යමණ්ඩල පරිපාලනය | - | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඈ) | ස්ථාවර වත්කම් පරිපාලනය | - | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු නොකිරීම. |